පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
12

# අවසාන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..............................................
..........................................................................................

කාලය : පැය 03 යි.

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

**සැලකිය යුතුයි :**

- ❖ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- ❖ **එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමි වේ.**

Education NCP - www.edncp.lk

01. සන්නිවේදනය, අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියකි. පුද්ගල අන්තර් සම්බන්ධතා ගොඩ නඟා ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුට ම සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ.

(i) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයෙහි අන්තර්ගත කොටස් දෙක නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය හඳුන්වා දීම පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සන්නිවේදනයේ ස්වභාවයට අදාළ ලක්ෂණ තුනක් විස්තර කරන්න.

(iv) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමේ අවශ්‍යතාව කරුණු හතරක් ඇසුරින් විග්‍රහ කරන්න.

02. ලොව පුරා බොහෝ විද්වත්හු සන්නිවේදනය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත. එම නිර්වචන පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ, සන්නිවේදන ක්‍රියාවලියේ බොහෝ අංග ඒවා තුළ අන්තර්ගත වන බවයි.

(i) සන්නිවේදනය පිළිබඳ ෂැනොන් සහ වීවර් දක්වන නිර්වචනය ලියන්න.

(ii) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය, පාසල් පද්ධතියට හඳුන්වා දීම පිළිබඳ අදාළ වර්ෂ අනුව පෙළගස්වන්න.

(iii) සන්නිවේදන මූලිකාංග හතරක් නම් කර, ඉන් දෙකක් සමාජය තුළ භාවිත වන ආකාරය විස්තර කරන්න.

(iv) සන්නිවේදන කාර්යයන් හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න.

03. අතීත මානවයා සාම්ප්‍රදායික ක්‍රමවේද තුළින් ඇරඹූ සන්නිවේදනය වර්තමානය වන විට, ඉතා සංකීර්ණවූත්, අධි තාක්ෂණික මෙවලම් භාවිත කරන්නාවූත් ක්‍රියාවලියක් බවට පත්ව ඇත.

(i) සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම හතරක් නම් කරන්න.

(ii) ජනමාධ්‍යවල ලක්ෂණ හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සමාජ මාධ්‍ය ප්‍රභේද තුනක් වත්මන් සන්නිවේදන ක්‍රියාවලිය සඳහා යොදාගත හැකි ආකාරය විග්‍රහ කරන්න.

(iv) "නව මාධ්‍ය භාවිතය, සමාජයට කරන බලපෑම" යන තේමාවට අදාළව කරුණු හතරක් ඇසුරින් විග්‍රහ කරන්න.


04. සන්නිවේදන ක්‍රියාවලියේ යථා ස්වභාවය වඩාත් විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම පිණිස ලොව පුරා විද්වතුන් විසින් විවිධ සන්නිවේදන ආකෘති නිර්මාණය කර ඇත.

(i) සන්නිවේදන වර්ග හතරක් නම් කරන්න.

(ii) ජනමාධ්‍යයේ ප්‍රධාන ප්‍රභේද දෙක දක්වා, එක් එක් ප්‍රභේදයට උදාහරණ දෙක බැගින් ලියන්න.

(iii) සුවිශේෂී සන්නිවේදන ස්වරූපයක් වන නිර්වාචික සන්නිවේදනය වත්මන් සමාජය තුළ භාවිත වන අවස්ථා තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(iv)




(a) ඉහත ආකෘතිය නම් කරන්න.

(b) මෙම ආකෘතියෙහි A, B, C අක්ෂර නම් කර, C හි ප්‍රධාන ප්‍රභේද දෙක නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

05. සංස්කෘතිය බිහි වූයේ සහ වර්ධනය වූයේ මානව සම්බන්ධතා සමඟමය. සමාජය, සංස්කෘතිය හා පුද්ගලයා යන මූලික සංරචක පවතින්නේ සහ ක්‍රියාත්මක වන්නේ සංදේශනය ඔස්සේ සිදුවන සමාජ අන්තර් ක්‍රියාකාරිත්වය නිසාය.

(i) සංස්කෘතිය පිළිබඳ බී. මැලිනොව්ස්කි දක්වන නිර්වචනයේ අන්තර්ගත අංග හතරක් නම් කරන්න.

(ii) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) අන්තර් සංස්කෘතික අධ්‍යයනයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(iv) මාධ්‍ය මගින් සංස්කෘතිය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම පිළිබඳ කරුණු හතරක් ඔස්සේ විචාරාත්මකව පහදන්න.

06. (i) අතථ්‍ය සන්නිවේදනයේ ලක්ෂණ හතරක් නම් කරන්න.

(ii) ගුවන් විදුලි මාධ්‍යයේ මූලික ලක්ෂණ හතරක් නම් කර, ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) සමාජ මාධ්‍ය අන්තර්ගත ලක්ෂණ තුනක් විස්තර කරන්න.

(iv) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් විග්‍රහ කරන්න.

07. වර්තමාන මාධ්‍ය පරිහරණයේ දී, විචාරශීලීත්වය යන්න, සුවිශේෂී ග්‍රාහක නිපුණතාවකි.

(i) යුරෝපා කොමිසම දක්වන නිර්වචනයට අනුව මාධ්‍ය සාක්ෂරතාවට අදාළ අංග හතර නම් කරන්න.

(ii) මාධ්‍ය විචාරයට අදාළ දෘෂ්ටිවාද දෙකක් කෙටියෙන් හඳුන්වන්න.

(iii) මාධ්‍ය සාක්ෂරතාවේ තෙවැදෑරුම් සිද්ධාන්ත විස්තර කරන්න.

(iv) මාධ්‍ය විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා හතරක් නම් කර, ඉන් දෙකක් සවිස්තරාත්මක ව විග්‍රහ කරන්න.

***

Education NCP - www.edncp.lk

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 12

# අවසාන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ...............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ...............................................
...............................................................................................

කාලය : පැය 02 යි.

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි :**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 50 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) (5) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරන්න.**

01. සන්නිවේදන අධ්‍යයනය විෂයය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආයතන ගත කිරීමට පියවර ගනු ලැබුවේ,
    (1) මහාචාර්ය විමල් දිසානායක මහතා
    (2) මහාචාර්ය විල්බර් ශ්‍රාම් මහතා
    (3) මහාචාර්ය එම්. බී. ආරියපාල මහතා
    (4) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා
    (5) මහාචාර්ය හැරල්ඩ් ඩී. ලැස්වෙල් මහතා (................)

02. "අදහස, දැනුම යනාදිය භාෂණය හෝ ලේඛනය හෝ සංඥා මගින් ප්‍රදානය කිරීම" යන නිර්වචනය ප්‍රකාශ කරන ලද්දේ,
    (1) චාල්ස් කුලි මහතා විසිනි.
    (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් මහතා විසිනි.
    (3) ෂැනොන් සහ වීවර් විසිනි.
    (4) ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය විසිනි.
    (5) ගෲන්වල්ට් ප්‍රකාශය විසිනි. (................)

03. කිසියම් පිරිසක්, පොදු අරමුණක් ඇතිව එකට එක්ව සිදුකරන සන්නිවේදනය හඳුන්වන්නේ,
    (1) සමූහ සන්නිවේදනය යනුවෙනි.
    (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යනුවෙනි.
    (3) අන්තර්පුද්ගල සන්නිවේදනය යනුවෙනි.
    (4) මහජන සන්නිවේදනය යනුවෙනි.
    (5) ජන සන්නිවේදනය යනුවෙනි. (................)

04. "සමාජ සංවිධානය" , "ජනමතය" හා "ජනතාව හා ඔවුන්ගේ ගැටලු" යන කෘති ඉදිරිපත් කළ විද්වතුන් වන්නේ,
    (1) විමල් දිසානායක මහතා, එඩ්වින් ආරියදාස මහතා, සුනන්ද මහේන්ද්‍ර මහතා
    (2) රේ එල්ඩන් හයිබර්ට්, ඩොනල්ඩ් ආර් අන්ගුරේට්, තෝමස් ඩබ්ලිව් බෝන්
    (3) හැරල්ඩ් ඩී ලැස්වෙල්, වොරන් වීවර්, විල්බර් ශ්‍රාම්
    (4) චාල්ස් කුලි, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩූවී
    (5) කර්ට් ලෙනින්, කාර්ල් අයිවර් හවුලන්ඩ්, ක්ලෝඩ් ෂැනොන් (................)

Education NCP - www.edncp.lk

05. පහත දැක්වෙන්නේ පාසලේ සිසු සිසුවියන් කණ්ඩායම් ගතව විෂය කරුණු සාකච්ඡා කිරීමේ දී ලබාගත් ප්‍රකාශනයන් ය.

A - සංජානනයන් අර්ථකථනය කරගැනීමට හැකි වීම

B - පංච ඉන්ද්‍රියයන්ට දැනෙන උත්තේජන මත ප්‍රතිචාර දැක්වීම

C - ප්‍රතිපෝෂණයන් නිරායාසයෙන් සිදු වීම

ඉහත ප්‍රකාශ අතුරෙන් අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයට අයත් වන්නේ,

(1) A, B පමණී. (2) A, B, C පමණී. (3) B, C පමණී.

(4) A පමණී. (5) A, B, C යන සියල්ලමය. (................)

06. ජන සන්නිවේදනය සතු ලක්ෂණයක් **නොවන්නේ,**

(1) පොදු පණිවිඩ විසරණය (2) ප්‍රතිපෝෂණය නොලැබීම හෝ ප්‍රමාද වීම

(3) දියුණු තාක්ෂණික මෙවලම් භාවිතය (4) සන්නිවේදකයා හා ග්‍රාහකයා අසම්මුඛ වීම

(5) තරඟකාරිත්වයක් නොමැති වීම

(................)

07. ඇරිස්ටෝටල් ආකෘතිය සම්බන්ධයෙන් කරුණු කීපයක් පහත දැක්වේ.

A - ප්‍රතිචාර ප්‍රතිපෝෂණයන් පිළිබඳව සඳහන් වීම

B - ඒක මාර්ගික ආකෘතියක් වීම

C - මූලික අංග පහක් පිළිබඳව අවධානය යොමු කිරීම

මින් නිවැරදි වන්නේ,

(1) A පමණී. (2) A, B පමණී. (3) B, C පමණී.

(4) B පමණී. (5) A, B, C යන සියල්ලමය. (................)

08. සංස්කෘතිය යන වචනය ප්‍රථම වරට සංකල්පයක් ලෙස භාවිතයට පැමිණියේ,

(1) 16 වන සියවසයේ දී ය. (2) 17 වන සියවසයේ දී ය.

(3) 18 වන සියවසයේ දී ය. (4) 19 වන සියවසයේ දී ය.

(5) 20 වන සියවසයේ දී ය. (................)

09. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමේ අවශ්‍යතාවයක් **නොවන්නේ,**

(1) මාධ්‍ය සාක්ෂරතාව ලබාගැනීම (2) විචාරශීලී මාධ්‍ය පරිහරණ කුසලතා ලබාගැනීම

(3) අවස්ථාවෝචිත භාෂා භාවිතය (4) සන්නිවේදන කුසලතා වර්ධනය කරගැනීම

(5) සංස්කෘතිය පිළිබඳ පමණක් අවබෝධය ලබාගැනීම (................)

10. දොරටුපාලකයෝ යනු,

(1) විද්‍යුත් උපකරණ පාලනය කරන පුද්ගලයන් ය.

(2) ජන මාධ්‍ය සඳහා අදහස් පල කරන පුද්ගලයන් ය.

(3) සන්නිවේදන ක්‍රියාවක නිරත වන පුද්ගලන් ය.

(4) ජන මාධ්‍යයන්හි සන්දේශ පාලනය කරන පුද්ගලයන් ය.

(5) ජන මාධ්‍යයේ ග්‍රාහක කණ්ඩායම නියෝජනය කරන පුද්ගලයන් ය. (................)

Education NCP - www.edncp.lk

11. අථත්‍ය සන්නිවේදනයේ ප්‍රධාන සංරචකය වන්නේ,

(1) අන්තර්ජාලයයි. (2) ගුවන් විදුලියයි. (3) රූපවාහිනියයි.
(4) සිනමාවයි. (5) කැමරාවයි. (................)

12. මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසින් ජනමාධ්‍ය ඉටු කළ යුතු ප්‍රධාන භූමිකා ලෙස දක්වා ඇත්තේ,

(1) ආරක්ෂකයෙකුගේ භූමිකාව, ගුරුවරයෙකුගේ භූමිකාව, දොරටුපාලකයකුගේ භූමිකාව
(2) ගුරුවරයෙකුගේ භූමිකාව, දේශකයකුගේ භූමිකාව, නායකයකුගේ භූමිකාව
(3) දෙමාපියන්ගේ භූමිකාව, ගුරුවරයෙකුගේ භූමිකාව, ආරක්ෂකයෙකුගේ භූමිකාව
(4) සාකච්ඡා මණ්ඩපයක භූමිකාව, ආරක්ෂකයකුගේ භූමිකාව, ගුරුවරයකුගේ භූමිකාව
(5) නිවේදකයකුගේ භූමිකාව, නායකයකුගේ භූමිකාව, මුර සෙබළකුගේ භූමිකාව (................)

13. 20 වැනි සියවසෙහි මාධ්‍ය සංස්කෘතිය සඳහා අවශ්‍ය වූ සංකල්පීය පදනම නිර්මාණය කළ පුරෝගාමියෙකු වූයේ,

(1) වෝල්ටන් ලිප්මාන් ය. (2) වෝල්ටර් බෙන්ජැමින් ය.
(3) චාල්ස් කූලි ය. (4) ජෝන් ඩූවි ය.
(5) වොරන් වීවර් ය. (................)

14. ජනමාධ්‍ය මගින් ඉදිරිපත් වන විවිධ සන්දේශ කියවා වටහා ගැනීමටත් එය භාවිත කිරීමටත් පවතින හැකියාව, නිපුණතාව හා දැනුම හඳුන්වන්නේ,

(1) සංජානනයයි. (2) දොරටුපාලක සංකල්පයයි.
(3) මාධ්‍ය සංස්කෘතියයි. (4) මාධ්‍ය සාක්ෂරතාවයයි.
(5) ගෝලීය සංස්කෘතියයි. (................)

15. වාචික සන්නිවේදන නිපුණතාවයක් වන්නේ,

(1) වාග් කෝෂය පුළුල් කරගැනීම (2) පසු සූදානම
(3) ඉදිරිපත් කිරීමේ ක්‍රම භාවිතය (4) පොදු අනන්‍යතාවයක් ගොඩ නඟා ගැනීම
(5) යෝග්‍ය උපකරණ භාවිතය
(................)

16. ලිඛිත සන්නිවේදනය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) කියවීමට හැකි ජනතාව සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව
(2) කථන සන්නිවේදනයට සාපේක්ෂව වඩාත් සංවිධානාත්මක ව ගොඩ නැඟිය හැකි වේ.
(3) අනාගත භාවිතය සඳහා තොරතුරු ගබඩා කර තැබිය හැකි ය.
(4) ප්‍රයෝජනවත් කාර්යය සඳහා අධ්‍යාපනය, නීතිමය කාර්යය සඳහා භාවිත කළ හැකි වීම
(5) ලිපි, දැන්වීම්, පුවත්පත් මාධ්‍ය පමණක් සන්නිවේදනය කිරීමට යොදා ගැනීම (................)

17. සමාජ මාධ්‍යයේ ප්‍රබලතාවයක් **නොවන්නේ,**

(1) පරිහරණය කරන කෙනාට සංස්කරණය කළ හැකි වීම
(2) ග්‍රාහකයාට කැමති ලෙස පරිහරණය කළ හැකි වීම
(3) අක්‍රීය ග්‍රාහකයන් වීම
(4) ක්ෂණික වීම
(5) දැනුම හුවමාරු කරගත හැකි වීම (................)

Education NCP - www.edncp.lk

18. පහත දැක්වෙන්නේ එක්තරා සන්නිවේදන වර්ගයක ලක්ෂණ කිහිපයකි.

A - නියමිත කාල රාමුවක්, න්‍යාය පත්‍රයක් අනුව ක්‍රියාත්මක කිරීමට හැකි වීම

B - නියමිත කාල රාමුවක්, න්‍යාය පත්‍රයක් අනුව ක්‍රියාත්මක කිරීමට හැකි වීම

C - කාල අවකාශ සීමාවන් පැන නොනැගීම

මින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.

(4) B හා C පමණි. (5) A, B, C යන සියල්ලමය. (................)

19. සුරංගනා කථා, මිථ්‍යා කථා, යෙදුම්, උපහැරණ කවි, සින්දු, ජන ගායනා මෙන්ම කෙම් ක්‍රම ද භාවිතා කරනු ලබන්නේ,

(1) මහජන සන්නිවේදනය තුළ ය. (2) අන්තර් පුද්ගල සන්නිවේදනය තුළ ය.

(3) අන්තර් වර්ගී පුද්ගල සන්නිවේදනය තුළ ය. (4) සාම්ප්‍රදායික සන්නිවේදනය තුළ ය.

(5) සමූහ සන්නිවේදනය තුළ ය. (................)

20. යම් ක්ෂේත්‍රයක් අරමුණු කරගෙන හෝ යම් පාඨක පිරිසක් ඉලක්ක කරගෙන නිශ්චිත කාල සීමාවලදී පළවන කෙටි ලිපි හා රූප සටහන් සහිත ප්‍රකාශනයක් හඳුන්වන්නේ,

(1) පුවත්පත් ලෙස ය. (2) සඟරාව ලෙස ය. (3) පොත් පිංච ලෙස ය.

(4) දින සටහන් ලෙස ය. (5) අත් පත්‍රිකා ලෙස ය. (................)

21. ලියාපදිංචි වූ සාමාජිකයන්ට තමන් වෘත්තීය දැනුමෙන් විශ්වාස කරන පුද්ගලයන් අතර ජාල ගොඩ නැංවීම සහ ලේඛනගත කිරීමට ඉඩ සලසන ව්‍යාපාරික ප්‍රජාව උදෙසා බිහි වූ සමාජ මාධ්‍ය ජාලය වනුයේ,

(1) Face book (2) Twitter (3) Skype

(4) Viber (5) Linkedin (................)

22. පහත දැක්වෙන්නේ සමාජ විද්‍යාඥයින් විසින් කිසියම් සමාජ ක්‍රමවේදයක් පිළිබඳ දැක් වූ අදහස් කීපයකි.

A - පුද්ගලයෙකුගේ උපතේ සිටම සිදුවන ක්‍රියාවලියකි.

B - වෙනස්වන සමාජ සංස්කෘතික තත්ත්වයන්ට පුද්ගලයා අනුවර්තනය කිරීම ය.

C - ඒ සඳහා මානව සමාජයෙහි සුවිශාල ආයතන සංඛ්‍යාවක් තිබේ.

මෙම සංකල්පය වන්නේ,

(1) සමාජානුයෝජනයයි. (2) ජනප්‍රිය සංස්කෘතියයි. (3) සංජානනයයි.

(4) සන්නිවේදනයයි. (5) මාධ්‍ය සංස්කෘතියයි. (................)

23. මාධ්‍ය මගින් පුද්ගල විශ්වාසයන්, ආකල්ප, අභිප්‍රාය හෝ හැසිරීම කෙරෙහි බලපෑම් කර පිළිගැනීමට යටත් කිරීම අභිප්‍රේරණය වේ. එහි මානයන් වන්නේ,

(1) අර්ථය, අදාළ බව, පෙළඹවීම

(2) ඒකාකාරී බව, ඇගයීම, පක්ෂපාතීත්වය

(3) ආකල්ප වෙනස් කිරීම, හැසිරීම් වෙනස් කිරීම, කාලයත් සමග වෙනස් කිරීම

(4) අනුක්‍රමය, සමබරතාවය, සුසංයෝගය

(5) විශේෂඥතාව, විශ්වාස කළ හැකි බව, කීර්ති නාමය (................)

Education NCP - www.edncp.lk

24. මූලය හෙවත් සන්නිවේදකයා ලබාගන්නා සංදේශය තාක්ෂණික ක්‍රියාදාමයකට යටත් වී කටහඬ විද්‍යුත් සංඥා බවට පත් කරයි. මෙහිදී සංදේශය විකාශය කළ හැකි සංඥා බවට පත් කරයි. එය හඳුන්වන්නේ,

(1) විකේතකරණයයි. (2) ආකේතකරණයයි. (3) සංජානනයයි.
(4) අර්ථ නිරූපණයයි. (5) තොරතුරු මූලාශ්‍රයයි. (................)

25. ජනකථාවල පවත්නා විශ්ව විභජන ඥාන උල්පත ලෙස සැලකෙන්නේ,

(1) ඥාණ ගවේෂණය (2) සාම්ප්‍රදායික සන්නිවේදනය
(3) ආකේතකරණයයි. (4) වෘතාන්තවේදයයි.
(5) සමාජානුයෝජනයයි. (................)

26. යුනෙස්කෝ සංවිධානයේ ගෘන්වල්ඩ් ප්‍රකාශය මඟින් කළ නිර්දේශය අනුව ප්‍රාථමික පාසලේ සිට විශ්ව විද්‍යාලය දක්වාත් වැඩිහිටි අධ්‍යාපනය තුළත් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන් ආරම්භ කිරීම සුදුසු යැයි නිර්දේශ කළ වර්ෂය වන්නේ,

(1) 1929 (2) 1989 (3) 1982
(4) 2006 (5) 2008 (................)

27. යුනෙස්කෝ සංවිධානය පාසල් විෂය ධාරාවට මාධ්‍ය අධ්‍යාපනය විෂයය ඇතුළත් කළ යුතු බව සඳහන් කිරීමට ආසන්නතම හේතුව වන්නේ,

(1) ජනමාධ්‍ය බිහිවීමයි.
(2) ජනමාධ්‍ය විසින් සමාජය වෙත කළ බලපෑම ඉහළ යාමයි.
(3) නව මාධ්‍යයේ සමාජ මෙහෙවර වර්ධනය වීමයි.
(4) ජනමාධ්‍ය ළමා හා තරුණ පරපුර කෙරෙහි ඇති කළ අහිතකර බලපෑමයි.
(5) ඉහත කිසිවක් නොවේ. (................)

28. සන්නිවේදනයේ මූලිකාංගයක් **නොවන්නේ**,

(1) සන්නිවේදකයායි. (2) සන්දේශයයි. (3) අත්දැකීම් පසුතලයයි.
(4) සන්දර්භයයි. (5) සංකේතාත්මක බවයි.
(................)

29. සන්නිවේදන ක්‍රියාවලිය මඟින් විවිධ කාර්යයන් ඉටු කරනු ලබයි. ඒ අතුරින් **නොගැළපෙන** පිළිතුර වන්නේ,

(1) බලපෑමයි. (2) අධ්‍යාපනයයි. (3) පෙළඹවීමයි.
(4) තොරතුරු සම්පාදනයයි. (5) විනෝදාස්වාදයයි. (................)

30. කාලාන්තරයක් තිස්සේ ගැමි ප්‍රජාව අතර තොරතුරු දැනුම, විවේකය, විනෝදය සඳහා භාවිතා කළ සන්නිවේදන ක්‍රමය සාම්ප්‍රදායික මාධ්‍යයයි. මෙවැනි සන්නිවේදනයක ලක්ෂණ කීපයක් පහත පරිදි වේ.

a - සරල ආකෘති පැවතීම b - නම්‍යශීලී බව
c - අවම පිරිවැය d - උපදේශාත්මක බව
e - පහසුවෙන් සපයාගත හැකි බව

ඉහත ලක්ෂණ අතුරින් නිරවද්‍ය ලක්ෂණ අන්තර්ගත කාණ්ඩය අයත් පිළිතුර වනුයේ,

(1) a හා b ය. (2) a හා c ය. (3) b හා c ය.
(4) a හා d ය. (5) ඉහත සියල්ල නිවැරදි ය. (................)

Education NCP - www.edncp.lk

31. ජනමාධ්‍ය සතු කාර්යභාරයක් ලෙස සැලකිය නොහැක්කේ,

(1) ක්ෂණික හා අඛණ්ඩ බව (2) ප්‍රමාදිත ප්‍රතිපෝෂණය

(3) සහසම්බන්ධතා ගොඩ නැඟීම (4) සංවිධාන ගත ආයතනික ව්‍යුහය

(5) ග්‍රාහක විෂම ජාතීය බව (................)

32. ශ්‍රී ලංකාවේ ප්‍රථම රජයේ ලියාපදිංචි කළ සිංහල පුවත්පත ලෙස සැලකෙන්නේ,

(1) "Samachar" පුවත්පතයි. (2) "ලක්මිණි පහණ" පුවත්පතයි.

(3) "ලංකා ලෝකය" පුවත්පතයි. (4) "The Oxford Gazette" පුවත්පතයි.

(5) "The Colombo Journal" පුවත්පතයි. (................)

33. නව මාධ්‍ය බිහිවීමත් සමඟ ඇති වූ විපර්යාසයන් විවිධ විද්වතුන් විසින් අධ්‍යයනය කරන ලදී. ඒ අතරින් සාවද්‍ය යැයි සිතිය හැක්කේ,

(1) මාර්ෂල් මැක්ලුහන් වේ. (2) ෆෙඩ්රික් කෙට්ලර් වේ.

(3) බර්නාඩ් ස්ටෙග්ලර් වේ. (4) පෝල් නිප්කෝව් වේ.

(5) මැනුවෙල් කැස්ටල් වේ. (................)

34. ශ්‍රී ලංකාවේ තිරගත වූ ප්‍රථම සිංහල චිත්‍රපටය ලෙස සැලකිය හැක්කේ,

(1) රේඛාව චිත්‍රපටයයි. (2) කඩවුණු පොරොන්දුව චිත්‍රපටයයි.

(3) කදා වළලු චිත්‍රපටයයි. (4) නිදානය චිත්‍රපටයයි.

(5) පවුරු වළල්ල චිත්‍රපටයයි. (................)

35. මානව පරිණාමයට සමගාමීව සිදු වූ සංස්කෘතික පරිණාමය පහත පරිදි විය.

A - මාධ්‍ය සංස්කෘතිය B - ජන සංස්කෘතිය

C - ගෝලීය සංස්කෘතිය D - ජනප්‍රිය සංස්කෘතිය

E - සාම්ප්‍රදායික සංස්කෘතිය F - සම්භාව්‍ය සංස්කෘතිය

ඉහත සංස්කෘතික පරිණාමයේ නිවැරදි අනුපිළිවෙල ලෙස සැලකිය හැක්කේ,

(1) A, B, D, E, F, C ය. (2) A, C, E, F, D, B ය. (3) B, A, C, D, F, E ය.

(4) E, B, F, D, A, C ය. (5) D, F, C, E, A, D ය. (................)

36. "මාධ්‍ය සාක්ෂරතාව යනු මාධ්‍යයෙන් සෑම ආකාරයකින්ම ඉදිරිපත් කරන සන්දේශ පරිහරණය කිරීමට, විශ්ලේෂණය කිරීමට, ඇගයුමට හා නිර්මාණය කිරීමට ලබාගන්නා හැකියාවයි." ලෙස නිර්වචනයක් ඉදිරිපත් කළේ,

(1) ඩබ්ලිව්. ජේම්ස් පෝටර්ය. (2) යුරෝපා කොමිසම ය.

(3) යුනෙස්කෝ සංවිධානයයි. (4) ඩේවිඩ් වයිට්

(5) බර්නාඩ් රොසෙන්බර්ග් (................)

37. මාධ්‍ය සන්දේශ ආධිපත්‍යය දරණ ආයතනයක් හා සම්බන්ධ සාවද්‍ය පිළිතුරක් වන්නේ,

(1) පුවත්පත (2) ගුවන් විදුලිය (3) අන්තර්ජාලය

(4) චිත්‍රපට (5) සඟරා (................)

38. විචාරශීලී මාධ්‍ය ග්‍රාහකයෙකුගේ ලක්ෂණයක් වන්නේ,

(1) විශ්ලේෂණය (2) ඇගයීම (3) අනුමානය

(4) සන්දේශ නිර්මාණය (5) නිගමනය (................)

Education NCP - www.edncp.lk

39. ඵලදායී සන්දේශයක අන්තර්ගත විය යුතු ගුණාංගයක් **නොවන්නේ,**

(1) තැම්පත් බව (2) සරල බව (3) විශේෂත්වය
(4) ව්‍යුහය (5) ඇල්ම (................)

40. ජනමාධ්‍ය හා සම්බන්ධ සාවද්‍ය පිළිතුර වන්නේ,

(1) අධික වේගයෙන් සන්නිවේදනය කිරීම (2) තාක්ෂණික මෙවලම් භාවිතය
(3) ක්ෂණික ප්‍රතිපෝෂණය (4) ග්‍රාහක ක්ෂේත්‍රයේ විශාලත්වය
(5) වෘත්තීය මාධ්‍යවේදීන් සිටීම (................)

41. ජන සන්නිවේදන ක්‍රියාවලිය වූ කලී ඉතා සංකීර්ණ ක්‍රියාවලියකි. එය තේරුම් ගැනීම සඳහා HUB (හබ්) ආකෘතිය නිර්මාණය කර ඇත. එය නිර්මාණය පිණිස දායක වූ විද්වතකු වන්නේ,

(1) තෝමස් ඩබ්ලිඩ් බෝන් (2) තෝමස් පෙපර්සන්
(3) මාර්ෂල් මැක්ලුහන් (4) බර්නාඩ් රොසෙන්බර්ග්
(5) එඩ්වඩ් වයිට් (................)

42. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීම මඟින් පුරවැසියෙකු තුළ වර්ධනය වන්නා වූ කුසලතා කීපයක් පහත දැක්වේ. ඒ අතුරින් නිරවද්‍ය **නොවන්නේ** කුමක් ද?

(1) මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය
(2) අවස්ථාවෝචිත භාෂා භාවිතය
(3) තොරතුරු පරිහරණය කිරීමේ නිපුණතාව
(4) ආර්ථික වශයෙන් දියුණුවක් ලැබීම
(5) සංවර්ධන ක්‍රියාවලියට පුරවැසියෙකු ලෙස දායක වීම (................)

43. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයක් ලෙස ඉගැන්වීම ලොව පුරා විශ්ව විද්‍යාල මට්ටමින් ඇරඹින. එය ලොව ප්‍රථමයෙන් ඇරඹූ විශ්ව විද්‍යාලය වන්නේ,

(1) පුනේ විශ්ව විද්‍යාලය (2) ඉලිනොයිස් විශ්ව විද්‍යාලය
(3) කැලණිය විශ්ව විද්‍යාලය (4) ඇමරිකානු රාජ්‍ය විශ්ව විද්‍යාලය
(5) කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය (................)

44. ප්‍රාථමික මානවයා විසින් භාවිතා කළ සන්නිවේදන ක්‍රමවලට අයත් **නොවන්නේ** යැයි ඔබ සිතන්නේ,

(1) කොළ අතු එල්ලීම (2) ගිණි මැල ගැසීම (3) අණ බෙර නාදය
(4) හූ හඬ (5) ලිපි හුවමාරුව (................)

45. සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය විවිධ කෘතිවල දායකත්වය යටතේ පෝෂණය වූවකි. පහත කෘති අතුරින් ඒ සඳහා දායක වූ ප්‍රධාන කෘතියකි.

(1) "මානව සන්නිවේදනය" නැමති කෘතිය
(2) "සන්නිවේදනය හා මිනිසා" නැමති කෘතිය
(3) "සංවර්ධන සන්නිවේදනය" නැමති කෘතිය
(4) "සමාජ සංවිධානය" නැමති කෘතිය
(5) "සන්නිවේදන ශබ්දාගාරය" නැමති කෘතිය (................)

Education NCP - www.ednecp.lk

46. වර්ෂ 1968 - 1969 කාලයේ දී පුවත්පත් කලාවේදය නැමති පාඨමාලාව ආරම්භය සඳහා එහි විෂය නිර්දේශය සකසනු ලැබූ විද්වතා වන්නේ,

(1) ආචාර්ය එඩ්වින් ආරියදාස මහතා ය. (2) මහාචාර්ය විමල් දිසානායක මහතා ය.
(3) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා ය. (4) මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ මහතා ය.
(5) මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා ය. (................)

47. ඕනෑම සන්නිවේදන ක්‍රියාවලියක් සිදුවීමේ දී එහි වටපිටාව පිළිබඳව නිරූපණය කරනු ලබන සන්නිවේදන මූලිකාංගය ලෙස සැලකෙන්නේ,

(1) අත්දැකීම් පසුතලය (2) බලපෑම වේ. (3) සන්දර්භය වේ.
(4) ඝෝෂණය වේ. (5) සන්දේශය වේ. (................)

48. රූපවාහිනී මාධ්‍ය තුළින් ග්‍රාහක ගත කරනු ලබන වෙළෙඳ දැන්වීම් තුළින් මූලික වශයෙන් අපේක්ෂා කරනු ලබන සන්නිවේදන කාර්යය වන්නේ,

(1) විනෝදාස්වාදයයි. (2) පෙළඹවීමයි. (3) උපදෙස් සම්පාදනයයි.
(4) සමාජානුයෝජනයයි. (5) සංස්කෘතික කාර්යයයි.

(................)

49. මිනිසා තම සමාජය සමඟ සංයෝජනය වීමේ ක්‍රියාවලිය,

(1) සහානුභූතිය නම් වේ. (2) අර්ථකථනය නම් වේ. (3) සුපරීක්ෂණය නම් වේ.
(4) සහසම්බන්ධය නම් වේ. (5) සමාජානුයෝජනය නම් වේ.

(................)

50. "සන්නිවේදන අධ්‍යයනය" ලෙස සන්නිවේදන විෂය ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් වශයෙන් භාවිතයට පෙර එහි අනතර්ගත වූ ප්‍රධාන විෂය කාණ්ඩය වන්නේ,

(1) මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, මානව විද්‍යාව
(2) භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව
(3) මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව
(4) මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව
(5) සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව (................)

Education NCP - www.edncp.lk

***